දිවි අහිමි කරගැනීම් පිළිබඳව මාධ්‍ය මගින් පුවත් වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී ආචාර ධාර්මික සහ ප්‍රවේසම් සහගත ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බව අපි නැවත නැවතත් පෙන්වා දී ඇත.

නිදසුන් ලෙසින් දක්වන්නේ නම්, දිවි අහිමි කරගත් ආකාරය පුවත් වාර්තාවන් තුළ පල කිරීම අධෛර්යමත් කෙරෙන්නේ, ඒ ඔස්සේ අනුකාරක දිවි අහිමි කරගැනීම් සිදුවීමේ ඉඩක් පවත්නා බැවිනි. එසේම දිවි අහිමි කරගැනීමට හේතු වූ කරුණු සරලව නොදක්වන ලෙසින් අවවාද කෙරෙන්නේ, දිවි අහිමි කරගැනීමක් පසුපස සංකීර්ණ කරුණු සමුදායක් පැවතිය හැකි බැවිනි. එසේම උපකාරක අංක දිවි අහිමි කරගැනීම් සම්බන්ධ පුවත් හා පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් පවත්නා අයෙකුගේ ජීවිතය බේරාගැනීමේ ඉඩක් විවර වේ.

ශ්‍රී ලංකාව තුළ 2019 වසරේදී සිදුවූ දිවි අහිමි කරගැනීම් සංඛ්‍යාව 3,135 කි. එනම් දිනකට දිවි අහිමි කරගැනීම් සාමාන්‍යය 8.5 කි. දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් මාධ්‍ය විසින් ආචාර ධාර්මික වීම වැදගත් බව අපි අවධාරණය කරන්නේද ඒ හෙයිනි.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා පොලිස් නිල වෙබ් අඩවිය, අපරාධ සංඛ්‍යාලේඛන (2019),
ප්‍රවේශය: [https://www.police.lk/index.php/item/138](https://www.police.lk/index.php/item/138)

හදිසි උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #SinhalaPress #Dinamina #Dinamina #Mawbima**